Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# දික්වැල්ල ප්‍රාදේශීය සභාව

දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත තනතුරු සඳහා දික්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර ලේකම්, ප්‍රාදේශීය සභාව, දික්වැල්ල යන ලිපිනයට 2018.12.10 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | පුස්තකාල සහායක | 02 | රා. ප. ච.3/2016 (PL1 2016) අනුව රු. 24,250 - 250 x 10- 270 x 10- 300 x 10 - 330 x 12- රු. 36,410 කි. 2020.01.01 සිට ක්‍රියාත්මක වන අතර ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව වැටුප හිමි වේ. | අ.පො. ස. (සා.පෙ.) දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත් වීම. |
| 02 | සෞඛ්‍ය කම්කරු | 01 | රා.ප.ච.3/2016 ( PL1 2016) අනුව රු. 24,250-250 x 10-270 x 10- 300 x 10-330 x 12- රු. 36,410කි. 2020.01.01 සිට ක්‍රියාත්මක වන අතර ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව වැටුප හිමිවේ. | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්වී තිබීම. |
| 03 | රියදුරු | 03 | රා.ප. ච. 3/2016 ( PL 3 2016) අනුව රු. 25,790- 270x10-300x10-330x10- 350x12 - රු. 38,990 කි. 2020.01.01 සිට ක්‍රියාත්මක වන අතර ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව වැටුප හිමි වේ. | අ. පො. ස. (සා.පෙ.) දෙවරකට නොවැඩි වාර ගණනකදී ඕනෑම විෂයයන් 06ක් සමත්වීම. |

03. *පැවරෙන කාර්ය භාරය :*

* පුස්තකාල සහායක :-පුස්තකාල ප්‍රමිතිකරණය අනුව පොත්පත් ගබඩා කිරීම, නිකුත් කිරීම හා ආරක්ෂා කිරීම සඳහා පුස්තකාලයාධිපතිට සහාය වීම හා පුස්තකාලයේ පවිත්‍රතාවය පවත්වා ගැනීම.
* සෞඛ්‍ය කම්කරු :-ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන ස්ථානවල පවිත්‍රතා කටයුතු නිසි පරිදි ඉටු කිරීම.
* රියදුරු :-ආයතනයට අයත් වාහන පැදවීම, ධාවන සටහන් පවත්වාගෙන යාම, නඩත්තු හා සේවා කටයුතු සම්බන්ධයෙන් නොපමාව අදාළ නිලධාරීන් දැනුවත් කිරීම.

04. *තනතුරෙහි ස්වභාවය :*

ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත්විය යුතුවේ.

05. *වෙනත් සුදුසුකම් :*

* පිළිගත් ආයතනයක සේවා පළපුරුද්ද, පුහුණුව, වෘත්තීය සුදුසුකම් ලබා ඇති අයට ප්‍රමුඛතාවය හිමි වේ.

* රියදුරු තනතුර සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද වලංගු බර වාහන රියදුරු බලපත්‍රය ලබා තිබිය යුතුය. අදාල බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.

06. *වයස :*

අයදුම්පත් කැඳවන දිනට වයස අවු. 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.

07. *වෙනත් :-*

අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතු අතර අයදුම්පත් කැඳවන අවසාන දිනට දික්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පූර්වාසන්න වසර 05ක හා අනුගාමී වසර 03ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

08. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

අයදුම්පත් කැඳවීමෙන් පසුව සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත බඳවා ගැනේ.

09. *ලකුණු දීමේ ක්‍රමවේදය :*

* පුස්තකාල සහායක/සෞඛ්‍ය කම්කරු :

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | 30 |
| පළපුරුද්ද | 10 |
| සභා බල ප්‍රදේශයේ පදිංචිය | 45 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 |

* රියදුරු

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - ලකුණු 50
(ii) වෘත්තීය සම්මුඛ පරීක්ෂණය - ලකුණු 50

එම්. එස්. රත්නවීර,
ලේකම්,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

ආදර්ශ අයදුම්පත්‍රය

**දික්වැල්ල ප්‍රාදේශීය සභාව**

***රියදුරු/පුස්තකාල සහායක/සෞඛ්‍ය කම්කරු තනතුර***

[ ]
කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

01. මුලකුරු සමඟ නම :.................................................................
02. මුලකුරුවලින් හැඳින්වෙන නම :.................................................................
03. ජාතික හැඳුනුම්පත් අංකය :.................................................................
04. ස්ථිර පදිංචි ලිපිනය :.................................................................
05. තැපැල් ලිපිනය :.................................................................
06. ජාතිය :.................................................................
07. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :.................................................................
08. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :.................................................................
09. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය :.................................................................
10. උපන් දිනය :.................................................................
11. 2018.12.10 වැනි දිනට වයස :.................................................................

12. අධ්‍යාපන සුදුසුකම් :.........................................................

13. පළපුරුද්ද :.........................................................

14. වෙනත් සුදුසුකම් :.........................................................

15. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවකු කර තිබේ ද? :.........................................................

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සකු කිරීමට හා බඳවා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව හොඳාකාරවම දනිමි.

..........................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :............................